DOI : 10.31357/fhssmst.2004.00641

# ඉඩම් කැබලි කිරීම භූමි පරිභෝග රටාවේ වෙනස්වීම කෙරෙහි දක්වන බලපෑම

( හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රිත අධ්‍යයනයක් )

එම්.පී. රංජනි ධනවර්ධන

GS/ SS/ 28 / 1996

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයෙහි ශාස්ත්‍රපති (භූගෝල විද්‍යා) උපාධි පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

2004

## පර්යේෂකයාගේ ප්‍රකාශය

ඉඩම් කැබලි කිරීම භූමි පරිහරණය කෙරෙහි දක්වන බලපෑම නැමති මෙම නිබන්ධය මහාචාර්ය එම්.ඩී.සී.අභයරත්න මහතාගේ උපදේශකත්වය යටතේ, මා විසින් ස්වාධිනව පර්යේෂණය කර ලියන ලදුව, 2005 දෙසැම්බර් 13 දින පවත්වන ලද වාචික පරීක්ෂණයෙන් පසු, ආචාර්ය එස්. එන්. වික්‍රමරත්න මහතාගේ උපදේශකත්වය යටතේ , සංශෝධනය කරන ලද්දකි. මෙම නිබන්ධය වෙනත් විශ්ව විද්‍යාලයකට ඉදිරිපත් කර නොමැති බව ද සහතික කරමි.

Ranjdaze

පර්යේෂකයාගේ අත්සන

09 MAR 2006

## පරීක්ෂකවරයාගේ අනුමැතිය

ඉහත අපේක්ෂිකාව විසින් සඳහන් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, 2005 දෙසැම්බර් 13 දින පැවැත්වුනු වාචික පරීක්ෂණයේදී යෝජිත සංශෝධන මෙහි ඇතුලත් කොට ඇති බවත් සහතික කරමි.


ආචාර්ය එස්. එන් . වික්‍රමරත්න , පරීක්ෂක

Dr.S.N.Wickramaratne
Head/ Department of Geography
University of Peradeniya

# සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ස්වභාවික සම්පත භූමිය ලෙස හැඳින්විය හැකි ය. ඒ අනුව වන සම්පත්, අභ්‍යන්තර ජලාශ, වන ජීවීන්, වෙරළ ආදිය භූමිය හා බැඳුණු සම්පත් ලෙස හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය හෙක්ටයාර 6,552,500 ක් වන අතර භාවිතයට ගන්නා භූමි ප්‍රමාණය 5,527,000 කි. භූමි පරිහරණය හා බැඳුණු ප්‍රධාන සාධකය ජනතාව වන අතර, ජන සංඛ්‍යාවේ වැඩිවීමත් සමගම, භූමි පරිහරණය වේගවත් වී පරිහරණ රටාවේ වෙනස්කම් ඇතිවිය. භූමිය සඳහා අධික ඉල්ලුම, ඒක පුද්ගල බිම් ප්‍රමාණය අඩුවීම මෙ නිසා සිදුවිය. වර්තමානය වන විට භූමිය හිඟවීමත් සමගම නවත් ගැටලු ඇතිවිය. ජන සංඛ්‍යාව වර්ධනය වනවිට ඉඩම කැබලිවීම, ඉඩම කැබලි කිරීම ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම සිදුවෙමින් පවතින ක්‍රියාවලියකි.

ඉඩම් කැබලිකිරීම භූමි පරිහරණය කෙරෙහි දක්වන බලපෑම යන්න වූ මෙම අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාවේ ඉඩම් කැබලි කිරීමේ ඉතිහාසය, ලෝකයේ ඉඩම් සම්බන්ධව පවතින විවිධ මත, පිළිබඳව සාකච්ඡා කෙරේ. අධ්‍යයනයේ අරමුණු, අධ්‍යයනය සඳහා භාවිත කළ ක්‍රමවේද සමීක්ෂණය සඳහා නියැදිය තෝරා ගැනීම, දත්ත රැස් කිරීම හා සම්බන්ධ පළමු පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරේ.

අධ්‍යයනය ප්‍රදේශය ලෙස තෝරාගත් හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පසුබිම යටතේ එහි පවත්නා ඉඩම් භුක්තිය, භූමි පරිහරණ රටාව ජන සංඛ්‍යාව වර්ධනය වීම ඉඩම් කෙරෙහි දක්වන බලපෑම පිළිබඳව දෙවන පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරේ.

එමෙන්ම හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ රාජ්‍යය අංශය මගින් සිදුකරන ඉඩම් කැබලි කිරීම පෞද්ගලික වෙන්දේසි ආයතනය මගින් සිදුකෙරෙන ඉඩම් කැබලි කිරීම පිළිබඳව ද ඉඩම් කැබලි කිරීමට හේතු වූ කරුණු පිළිබඳව ද සවිස්තරව තෙවැනි පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරේ.

සිව්වන පරිච්ඡේදයේ දී අධ්‍යයනයේ නියැදිය සඳහා තෝරාගත් රාජ්‍යය අංශයේ හා පෞද්ගලික අංශයෙන් වැඩි වශයෙන් ඉඩම් කැබලි වූ වසම් වල පිහිටීම, ජන සංඛ්‍යාව, ඉඩම් කැබලිකර ඇති ආකාරය ආදී පොදු තොරතුරු සාකච්ඡාවට ගෙන ඇත. පසුව නියැදියට අයත් ගම්වැසියන්ගේ වර්තමාන සමාජ ආර්ථික තත්ත්වය, පදිංචි වී ඇති ඉඩමේ ස්වරූපය ඉඩම් සඳහා ඇති අයිතිය, ඉඩම් ලබාගැනීමට හේතු වූ කරුණු ඉඩම සඳහා පොදු පහසුකම් සපයා තිබූ ආකාරය සහා ඉඩම් ලාභීන්ට මුහුණදීමට සිදුවන ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම සිව්වන පරිච්ඡේදයේ දී සිදුකෙරේ. රාජ්‍යය හා පෞද්ගලික අංශ දෙක මගින් ඉඩම් කැබලි කිරීමේ දී හා ලබාදීමේදී කටයුතු කරන ආකාරය විවිධ වන අතර, ඒ ඒ ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ සමාජ ආර්ථික මට්ටම ද විවිධාකාරය.එම නිසා විවිධ ගැටලු වලට මුහුණදීමට ඔවුන්ට සිදුවේ.

විවිධ වූ ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ දී ඇති රජයෙන් දෙන ලද හා පෞද්ගලිකව මිලදීගත් ඉඩම්වල පදිංචිකරුවන්ගේ තත්ත්වය පිළිබඳ සමීක්ෂණයෙන් ලද තොරතුරු මත එළඹුණු විවිධ වූ නිගමන රාශියක් ඇති අතර ගැටලු සහගත අවස්ථා නිරාකරණය සඳහා කළ හැකි විසඳුම් කිහිපයක් ද පස්වන පරිච්ඡේදයේ දී ඉදිරිපත් කර ඇත.

පිදුම

මෙලොවට මා ජනිත කළ

සදාදර මා පියන්ට,

සිප්සෙත බෙදාදුන්

දයාබර ගුරුවරුන්ට,

ජීවිතයට අරුතක් එක්කළ

ස්වාමියාට හා දරු දෙදෙනාට

හදපිරි බැති සිතින් පිළිගන්වමි.

## ස්තුතිය

උපදේශකත්වය සපයමින් සෑම අවස්ථාවකදීම මා දිරිමත් කරමින් නොමදව සහාය දැක්වූ මහාචාර්ය එම්.ඩී.සී. අබේරත්න මහත්මාට ද, ආචාර්ය එස්.එන්. වික්‍රමරත්න මහත්මාට ද විවිධ වූ ගැටලු අවස්ථාවල දී උපරිම සහයෝගය ලබාදුන් පශ්චාද් උපාධි අධ්‍යාපන පීඨයේ හිටපු පීඨාධිපති මහාචාර්ය එම්.එම්. කරුණානායක මහත්මාටද පශ්චාද් උපාධි අධ්‍යාපන පීඨයේ පීඨාධිපතිනිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට ද නන් අයුරින් සහයෝගය දැක් වූ භූගෝල විද්‍යා අධ්‍යනාංශයේ මහාචාර්ය ධම්මිකා වනසිංහ මහත්මියටද, භූගෝල විද්‍යා අධ්‍යනාංශ ප්‍රධාන සි.කේ.එම්.දෙහෙරගොඩ මහත්මාටද, ආචාර්ය එන්.එල්.ඒ.කරුණාරත්න මහත්මාටද, ආචාර්ය සුනේත්‍රා තෙන්නකෝන් මහත්මියටද, ආචාර්ය ආර්.එම්.කේ.රත්නායක මහත්මාටද, භූගෝල විද්‍යා අධ්‍යනාංශයේ සියලුම කාර්ය මණ්ඩලයට ද,

ඉඩම් පරිහරණය හා ප්‍රතිපත්ති සැලසුම්කරණ අංශයේ ප්‍රධාන කර්යාලයේ අධ්‍යක්ෂ,නියෝජ්‍ය අධ්‍යක්ෂ ජයනන්ද මහත්මා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටද, කළුතර කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩලයට ද හොරණ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ හා හොරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ සියලුම නිලධාරීන්ට ද, අවශ්‍ය දත්ත සපයා දෙමින් සහාය දැක්වූ ඉංගිරිය,නලගල,කුරණ දකුණ,දික්හේනගම ග්‍රාම නිලධාරින්ට හා ගම්වාසින්ටද හොරණ කොට්ඨාශයේ පෞද්ගලික ඉඩම් වෙන්දේසි ආයතන වල නිලධාරීන්ටද , මහවැලි අධිකාරියේ කාර්මික නිලධාරී බී.එම්. නිශ්ශංක මහත්මාට ද ,

නිරතුරුව මා දිරිමත් කරමින් උපරිම සහාය දැක්වූ පියල් සේනානායක මහත්මාටද දූ සඳලිටද, පුතු පවන්ට ද, හිතවත් දයානන්ද සේරසිංහ මහත්මයාට ද, අබ්දුල් වාහිඩ් මහත්මාට ද, සුනිතා නංගිටද, පුෂ්පා, ශිරානි, චන්දිමා, කිංස්ලි යන සොයුර සොයුරියන්ටද, පරිගණක කටයුතු කරදුන් සුනිතා සිල්වා මහත්මියට ද මාගේ හදපිරි කෘතඥ පූර්වක ස්තුතිය පිරිනමමි.

# පටුන

| | පිටුව |
|---|---|
| පර්යේෂකයාගේ ප්‍රකාශය | ii |
| පරීක්ෂකවරයාගේ අනුමැතිය | iii |
| සංක්ෂිප්තය | iv |
| පිදුම | v |
| ස්තුතිය | vi |
| පටුන | vii-x |
| වගු,සිතියම්, ප්‍රස්තාර සහ රූප සටහන් | xi-xiii |
| **පළමු පරිච්ඡේදය - හැඳින්වීම** | 1 - 22 |
| 1.0 අධ්‍යයනයේ පසුබිම | 1 - 2 |
| 1.1 ශ්‍රී ලංකාවේ ඉඩම් භාවිතය | 3 - 10 |
| 1.2 ශ්‍රී ලංකාවේ ඉඩම් කැබලිවීමේ ඉතිහාසය | 11-17 |
| 1.3 අධ්‍යයනයේ අරමුණු | 17-18 |
| 1.4 අධ්‍යයනයේ ක්‍රමවේදය | 18 |
| 1.5 නියැදිය තෝරා ගැනීම | 19 |
| 1.6 දත්ත හා තොරතුරු රැස් කිරීම | 20-22 |
| 1.7 අධ්‍යයනයේ සීමාවන් | 22 |
| **දෙවන පරිච්ඡේදය - අධ්‍යයනය ප්‍රදේශයේ පසුබිම** | 23-36 |
| 2.0 හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම හා භෞතික පසුබිම | 23-26 |
| 2.1 හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්නා ඉඩම් භුක්තිය | 26-27 |
| 2.2 ඉඩම් පරිහරණ තත්ත්වය | 28-36 |
| 2.3 ජන සංඛ්‍යා වර්ධනය ඉඩම් කෙරෙහි දක්වන බලපෑම් | 36-40 |

**තුන්වන පරිච්ඡේදය - ඉඩම් කැබලි කිරීමේ ස්වරූපය** 41-59

3.0 ඉඩම් කැබලි කිරීම සිදුවන ආකාරය 41
3.1 රාජ්‍යය අංශය මගින් ඉඩම් කැබලි කිරීම 41
3.1.1 නිවාස යෝජනා ක්‍රම සඳහා ඉඩම් බෙදීම 42-43
3.1.2 ගම් පුළුල් කිරීම යටතේ ඉඩම් බෙදාදීම 44-45
3.1.3 පොදු පරමාර්ථ යටතේ ඉඩම් බෙදාදීම 45

3.2 පෞද්ගලික අංශය මගින් ඉඩම් කැබලි කිරීම 46
3.2.1 කැබලිකර වෙන්දේසි කිරීම 46-51
3.2.2 උරුමය අනුව ඉඩම් බෙදියාම 51

3.3 ඉඩම් කැබලි කිරීමට හේතු වූ කරුණු 52
3.3.1 භූමිය කැබලි කිරීමට හේතු වූ කරුණු 52-53
3.3.2 නාගරික ප්‍රදේශවල ඉඩකඩම් සීමාවීම නිසා ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල සිදුවන විකාශනය 53-59

**සිව්වන පරිච්ඡේදය - තෝරාගත් ගම් කිහිපයක භූමි පරිහරණ රටාවේ සිදු වී ඇති වෙනස්කම්** 60- 130

4.0 හැඳින්වීම 60
4.1 තෝරාගත් ගම්වල පිහිටීම 60-61
4.1.1 ජන සංඛ්‍යාව 61-66
4.1.1.1 පෞද්ගලික ඉඩම්වල පදිංචි ජන සංඛ්‍යාව 61-64
4.1.1.2 රජයේ ඉඩම්වල පදිංචි ජන සංඛ්‍යාව 64-66
4.1.2 භූමි පරිහරණය සිදුවී ඇති වෙනස්කම් 66-78
4.1.2.1 පෞද්ගලික අංශයේ ඉඩම්වල භූමි පරිහරණය 66-70
4.1.2.2 රාජ්‍යය අංශයේ ඉඩම්වල භූමි පරිහරණය 70-78

4.1.3 ඉඩම් කැබලි කිරීමේ දි සිදු වී ඇති වෙනස්කම් 78-84
4.1.3.1 පෞද්ගලික අංශයේ ඉඩම්වල සිදුවන කැබලි කිරීම. 78-81
4.1.3.2 රාජ්‍යය අංශයේ ඉඩම් වල සිදුවන කැබලිකිරීම. 81-84

4.2 කැබලි කරනලද ඉඩම්වල වර්තමානයේ පවතින සමාජ ආර්ථික තත්වය 84-99

4.2.1 සමාජ තත්ත්වය 84

4.2.1.1 පෞද්ගලික අංශයෙන් කැබලි කරනලද ඉඩම්වල පදිංචි පුද්ගලයින්ගේ සමාජ තත්ත්වය 84-89

4.2.1.2 රාජ්‍ය අංශයෙන් කැබලි කරන ලද ඉඩම්වල පදිංචි පුද්ගලයින්ගේ සමාජ තත්ත්වය 89

4.2.2 ආර්ථික තත්ත්වය 93-103

4.2.2.1 පෞද්ගලික අංශයේ ඉඩම්වල පදිංචි කරුවන්ගේ ආර්ථික තත්ත්වය 94-97

4.2.2.2 රාජ්‍ය අංශයේ ඉඩම්වල පදිංචිකරුවන්ගේ ආර්ථික තත්ත්වය 98-103

4.2.3 ඉඩමේ ස්වරූපය 103-105

4.2.3.1 පෞද්ගලික අංශයෙන් කැබලි කරන ලද ඉඩම්වල ස්වරූපය 103-104

4.2.3.2 රාජ්‍ය අංශයෙන් බෙදා දෙන ලද ඉඩම්වල ස්වරූපය 104-105

4.2.4 භූමිය සඳහා ඇති අයිතිය 105-109

4.2.4.1 පෞද්ගලික අංශයෙන් කැබලි කරන ලදඉඩම්වල අයිතිය 105-108

4.2.4.2 රාජ්‍ය අංශයෙන් බෙදා දෙන ලද ඉඩම් සඳහා ඇති අයිතිය 108-109

4.2.5 වෙන්දේසි කරන ඉඩම් පිළිබඳ තොරතුරු ලබාගත් ආකාරය 109-111

4.2.5.1 පෞද්ගලික වෙන්දේසි කරන ලද ඉඩම් පිළිබඳ තොරතුරු ලබාගත් ආකාරය 109-110

4.2.5.2 රාජ්‍ය අංශයෙන් ප්‍රදානය කරනු ලබන ඉඩම් පිළිබඳ තොරතුරු ලබාගත් ආකාරය 110-111

4.2.6 ඉඩම් ලබා ගැනීමට හේතුව 111-114

4.2.6.1 පෞද්ගලික අංශයෙන් ඉඩම් ලබා ගැනීමට හේතුව 111-113

4.2.6.2 රාජ්‍ය අංශයෙන් ඉඩම් ලබා ගැනීමට හේතුව 114

4.2.7 පොදු පහසුකම් සපයා තිබූ ආකාරය

4.2.7.1 පෞද්ගලික අංශයේ ඉඩම් සඳහා පොදු පහසුකම් සපයා තිබූ ආකාරය 114-116

4.2.7.2 රාජ්‍ය අංශයේ ඉඩම් සඳහා පොදු පහසුකම් සපයා තිබූ ආකාරය 116-117

4.2.8 රැකියා සඳහා පිටපත් යන දුර ප්‍රමාණය හා ආකාරය 117-121

4.2.8.1 පෞද්ගලික අංශයෙන් කැබලිකරන ලද ඉඩම්වල පදිංචිකරුවන් රැකියා සඳහා යන ආකාරය 117-118

4.2.8.2 රාජ්‍ය අංශයෙන් බෙදා දෙන ලද ඉඩම් වල පදිංචිකරුවන් රැකියා සඳහා යන ආකාරය 119-121

4.2.9 ප්‍රදේශයේ දක්නට ලැබෙන ගැටලු 122-130

4.2.9.1 පෞද්ගලිකව වෙන්දේසි කරන ලද ඉඩම්වල පවතින ගැටලු 122-124

4.2.9.2 රජයෙන් බෙදා දෙන ලද ඉඩම්වල පවතින ගැටලු 125-129

4.2.10 පෞද්ගලික වෙන්දේසි ආයතනවලට මුහුණ දීමට සිදුවන ගැටලු 130

**පස්වන පරිච්ඡේදය - නිගමන හා යෝජනා** 131-140

51. නිගමන 131-137

52. යෝජනා 138-140

5.0 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 141-143

6.0 ඇමුණුම් නාමාවලිය 144-152

I ප්‍රශ්නාවලිය 144-148

II සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී වූවන්ගේ ලේඛනය 149

III පෞද්ගලික වෙන්දේසි ආයතන ඉඩම් විකිණීම සඳහා භාවිත කරන දැන්වීම් 150

**IV රූප සටහන 2.1: ලංකාවේ භූමි පරිහරණයේ සිදුවූ වෙනස්කම් (1950 - 1990)** 152

## වගු,සිතියම්, ප්‍රස්තාර, රූප සටහන් නාමාවලිය


| වගු | | පිටුව |
|---|---|---|
| වගු අංක 1.1 | ඉඩම් භාවිතය පිළිබඳ තොරතුරු - (1 982) | 3 |
| වගු අංක 1.2 | ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගාවන්ට අයත් කෘෂිබිම් වෙනස් වී ඇති ආකාරය | 6 |
| වගු අංක 1.3 | 1935 - 1996 කාලය තුළ ශ්‍රී ලංකා රජය විසින් මහජනතාවට බෙදා දී ඇති ඉඩම් කැබලි | 8 |
| වගු අංක 1.4 | ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගාවන්ට අයත් ඉඩම් කැබලි (කට්ටි) සංඛ්‍යාව (1980 - 1992) | 10 |
| වගු අංක 1.5 | 1973 වන විට ගොවි ජනපද ව්‍යාපාර යටතේ ඉඩම් බෙදා දීම | 15 |
| වගු අංක 1.6 | රාජ්‍යය අංශයේ ඉඩම් වැඩි වශයෙන් කැබලි කරන ලද ග්‍රාම නිලධාරී වසම් වලින් තෝරාගත් සියයට දහයේ නියැදි ප්‍රමාණය | 19 |
| වගු අංක 1.7 | පෞද්ගලික අංශයේ ඉඩම් වැඩි වශයෙන් කැබලි කරන ලද ග්‍රාම නිලධාරී වසම් වලින් තෝරාගත් සියයට දහයේ ප්‍රමාණය | 19 |
| වගු අංක 2.1 | හොරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ රාජ්‍යය අංශය බෙදා දෙන ලද ඉඩම් වර්ග කර ඇති ආකාරය | 27 |
| වගු අංක 2.2 | හොරණ ප්‍රදේශිය ලේකම් කොට්ඨාසයේ ඉඩම් පරිහරණය (1997) | 28 |
| වගු අංක 2.3 | හොරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ප්‍රධාන භෝග වගා බිම් ප්‍රමාණය (1981) | 31 |
| වගු අංක 2.4 | හොරණ ප්‍රදේශිය ලේකම් කොට්ඨාසයේ සාමාන්‍ය ඉඩම් පරිහරණය ස්වරූපය (1996) | 32-33 |
| වගු අංක 3.1 | රාජ්‍යය අංශයේ ඉඩම් බෙදාදීම | 44 |
| වගු අංක 3.2 | හොරණ ප්‍රදේශිය සභාවේ අනුමැතිය පරිදි වෙන්දේසි කළ ඉඩම් ප්‍රමාණය (1991-2000) | 47-48 |
| වගු අංක 3.3 | 1991 සිට 2000 දක්වා පෞද්ගලිකව ඉඩම්හිමියන් වෙන්දේසි කළ ඉඩම් ප්‍රමාණය | 49-50 |
| වගු අංක 3.4 | තෝරාගත් ගම්මාන කිහිපයක ඉඩම් කැබලිවීම (1990-2001) | 55 |
| වගු අංක 3.5 | හොරණ නගරය තුළ ඉඩම්වල වෙන්වීමේ ප්‍රමාණය (2002) | 56 |
| වගු අංක 4.1 | තලගල හා දික්හේනගම ග්‍රාම නිලධාරී වසම් වල ජනසංඛ්‍යා වර්ධනය (1985-2001) | 63 |
| වගු අංක 4.2 | ඉංගිරිය හා කුරණ ග්‍රාම නිලධාරී වසම් වල ජන සංඛ්‍යා වර්ධනය (1985-2001) (1985-2002) | 65 |

වගු අංක 4.3 තලගල ග්‍රාම නිලධාරී වසමේ සිදුවූ භූමි පරිහරණ වෙනස්කම් (1985-2001) 66

වගු අංක 4.4 දික්හේනගම ග්‍රාම නිලධාරී වසමේ සිදුවූ භූමි පරිහරණය වෙනස්කම් (1985-2001) 69

වගු අංක 4.5 ඉංගිරිය ග්‍රාම නිලධාරී වසම තුළ භූමි පරිහරණයේ සිදුවූ වෙනස්කම් (1970-2001) 72

වගු අංක 4.6 කුරණ දකුණ ග්‍රාම නිලධාරී වසම තුළ භූමි පරිහරණයේ සිදු වූ වෙනස්කම් 75

වගු අංක 4.7 තලගල ග්‍රාම නිලධාරී වසම තුළ ඉඩම් කැබලි කිරීම (1990-2000) 78-79

වගු අංක 4.8 දික්හේනගම ග්‍රාම නිලධාරී වසම තුළ ඉඩම් කැබලි කිරීම (1990-2000) 80

වගු අංක 4.9 ඉංගිරිය ග්‍රාම නිලධාරී වසම තුළ ඉඩම් කැබලි කිරීම (1970-2001) 81

වගු අංක 4.10 කුරණ දකුණ ග්‍රාම නිලධාරී වසම තුළ ඉඩම් කැබලි කිරීම 83

වගු අංක 4.11 පෞද්ගලික අංශයේ නියැදියට අයත් ජනසංඛ්‍යාව 85

වගු අංක 4.12 පෞද්ගලික අංශයේ නියැදියට අයත් පුද්ගලයින්ගේ අධ්‍යාපන තත්ත්වය 87

වගු අංක 4.13 රාජ්‍ය අංශයේ නියැදියට අයත් ජන සංඛ්‍යාව 90

වගු අංක 4.14 රාජ්‍ය අංශයේ නියැදියට අයත් පුද්ගලයින්ගේ අධ්‍යාපන තත්ත්වය 92

වගු අංක 4.15 පෞද්ගලික අංශයේ නියැදියට අයත් ජනතාවගේ රැකියාවන්හි ස්වරූපය 94

වගු අංක 4.16 පෞද්ගලික අංශයේ නියැදියට අයත් පවුල් ඒකකයන්හි ආදායම් තත්ත්වය 95-96

වගු අංක 4.17 රාජ්‍ය අංශයේ නියැදියට අයත් ප්‍රදේශයේ රැකියාවන්හි නියුතු පුද්ගලයින් සංඛ්‍යාව 98

වගු අංක 4.18 රාජ්‍ය අංශයේ නියැදියට අයත් ජනතාවගේ රැකියාවන්හි ස්වරූපය 99

වගු අංක 4.19 රාජ්‍ය අංශයේ නියැදියට අයත් පවුල් ඒකකයන්හි මාසික ආදායම 101

වගු අංක 4.20 පෞද්ගලික අංශයේ නියැදියට අයත් පුද්ගලයින් ඉඩම් ලබාගැනීමට හේතු වූ කරුණු 112

වගු අංක 4.21 පෞද්ගලික අංශයේ නියැදියට අයත් ඉඩමේ සිට මාර්ගයට ඇති දුර 115

වගු අංක 4.22 පෞද්ගලික අංශයේ ඉඩම්වල පදිංචි කරුවන් රැකියා සඳහා ගමන් කරන දුර ප්‍රමාණය 117

වගු අංක 4.23 රාජ්‍ය අංශයෙන් බෙදා දෙන ලද ඉඩම්වල පදිංචි කරුවන් රැකියා සඳහා පිටත්ව යන දුර ප්‍රමාණය 119

වගු අංක 4.24 නියැදියට අයත් තලගල හා දික්හේනගම ප්‍රදේශයන්හි දක්නට ලැබෙන සමාජීය ගැටලු 124

වගු අංක 4.25 මහ ඉංගිරිය ග්‍රාම නිලධාරී වෙත වාර්තා වූ පැමිණිලි 128

## සිතියම්

| | | පිටුව |
|---|---|---|
| 2.1 | කලුතර දිස්ත්‍රික්කයේ පිහිටීම හා පරිපාලන බෙදීම | 25 |
| 2.2 | 1959 භූමි පරිහරණ සිතියම් (හොරණ ප්‍රාදේශිය කොට්ඨාසය) | 29 |
| 2.3 | 1997 භූමි පරිහරණය සිතියම් (හොරණ ප්‍රාදේශිය කොට්ඨාසය) | 30 |
| 2.4 | හොරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස තුළපවතින මාර්ග රටාව | 34 |
| 2.5 | හොරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ජන ඝනත්වය | 38 |
| 2.6 | හොරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුළ සේවා මධ්‍යස්ථාන | 40 |
| 4.1 | නියැදිය සඳහා තෝරාගත් ග්‍රාම නිලධාරි වසම් වල පිහිටීම | 62 |

## ප්‍රස්තාර

| | | |
|---|---|---|
| 4.1 | තලගල ග්‍රාම නිලධාරි වසම තුළ භූමි පරිහරණය | 68 |
| 4.2 | දික්හේනගම ග්‍රාම නිලධාරි වසම තුළ භූමි පරිහරණය | 71 |
| 4.3 | ඉංගිරිය ග්‍රාම නිලධාරි වසම තුළ භූමි පරිහරණය | 74 |
| 4.4 | කුරණ දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ භූමි පරිහරණය | 77 |

## රූප සටහන / ඇමුණුම iv

| | | |
|---|---|---|
| 1.1 | ශ්‍රී ලංකාවේ ඉඩම් භාවිතයේ සිදුවූ වෙනස්කම් (1956-1990) | 152 |

## සංඛ්‍යා සටහන

| | | |
|---|---|---|
| 2.1 | මොරගහහේන නගරය තුළ සේවාවන්හි වර්ධනය | 35-36 |

# පළමුවන පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.0 අධ්‍යයනයේ පසුබිම

පෘථිවියෙහි අප ජීවත්වන මතු පිට තලය භූමිය ලෙස සැලකේ. භූමිය සීමිත සම්පතකි. භූමියට පස, අභ්‍යන්තර භූ ව්‍යුහය, භූ රූප , ස්වභාවික ජලාශ, සත්ත්ව හා ශාක ද ඇතුලත්වේ. නීතිය අනුව බලනවිට භූමිය යනු පස හෝ පොලව මතුපිට බිම් කැබැල්ලක් වන අතර හිමිකමක් ද ඇති බව අදහස් වේ. එමෙන්ම මිනිසා විසින් කළ ගොඩනැගිලි, වායුගෝලය සහ පෘථිවි තලය ද මෙයට ඇතුලත්වේ.පෘථිවි තලයෙහි තුනෙන් දෙකක්ම සාගර වන අතර, ගොඩ බිම තුනෙන් එකකි. අති විශාල ජන සංඛ්‍යාවකගේ සියලු අවශ්‍යතා සපුරා ගැනීම සඳහා දායකවන ප්‍රධාන සම්පත භූමියයි.

මිනිසා විසින් භාවිත කර ඇත්තේ කෙසේද එය භූමි පරිහරණ ලෙස සැලකේ මිනිසා ජනාවාස සඳහා මෙන්ම කෘෂිකාර්මික කටයුතු,කර්මාන්ත , සහ විනෝදාස්වා ද කටයුතු සඳහා ද භූමිය භාවිත කරයි. ශ්‍රී ලංකාවේ පවතින අවිධිමත් භූමි භාවිතයෙන් හේතුකොට ගෙන ස්වාභාවික උපද්‍රව වලින් වන බලපෑම් වැඩිවීමේ ප්‍රවනතාවක් පසුගිය දශක කිපයතුල පැහැදිලිවම දැකගත හැකිවිය.

ජන සංඛ්‍යාවේ වර්ධනයත් සමග භූමිය වර්ධනය නොවේ. එම නිසා භූමිය කැබලිවීම (land fragmentation ) සිදුවේ.ලෝකයේ විවිධ ප්‍රදේශවල ජන සංඛ්‍යාව වැඩිවීමත් සමග බිම්වලට ඇතිවන පීඩනය, කෘෂිබිම් කැබලිවීම හා ඒ නිසා කෘෂිකර්මයේ ඇති වන වෙනස් කම් පිළිබඳ ව න්‍යායන් කිහිපයක් ම බිහි වී ඇත.

තාක්ෂණය රැකියා සැපයුම, වැඩිවන ජන සංඛ්‍යාවේ වර්ධනයත් සමගම වැඩිවෙමින් පවත්නා ඉඩම් හිඟයක් එයට ගැමි ජනතාවගේ ප්‍රතිචාර කෙසේද යන්නත් පිළිබඳ ව පර්යේෂණය කළ අය අතර1965 දී මොල්තස් (Malthus) හා බොසරප් (Boserup) හා මාක්ස් (Marx) ද, 1981 දී හා 1971 දී පිළිවෙලින් හෙයාමි (Hayami) රටින් (Ruttan) ද 1978 දී බින්ස්වැන්ගර් (Binswanger) ද ප්‍රමුඛස්ථානයක් ගනී.

ස්විස්ටර්ලන්තයේ ඇල්ප්ස් කඳු ආශ්‍රිතව කුඩා ඉඩම් හිමි ජනතාවගේ වර්ධනයක්, ඒ හා සමඟම සිදුවන මරණ සංඛ්‍යාවේ වැඩිවීමත්, අඩු පෝෂණ තත්ත්වයක්, රෝගාබාධත්, යුදමය තත්ත්වයත් නිසා ගැටලු ඇති විය. මේ පිළිබඳ ව මෝල්තස් විසින් න්‍යායක් ඉදිරිපත් කර ඇත. මෝල්තස්, බොසරප් හා මාක්ස් විවිධ දිසාවන් ඔස්සේ අදහස් දක්වා තිබේ.

ජන සංඛ්‍යා වර්ධනය, ඉඩම් බෙදා දීම හා කැබලිවීම, වැඩිවන ජනගහනයට අවශ්‍ය ආහාර ලබා ගැනීමට ඇති හැකියාව, ලබා ගත හැකි ආහාර ප්‍රමාණය, බිම් ඒකකයකින් වැඩි ඵලදාවක් ලබා ගත හැකි ආකාරය පිළිබඳවත්, ඒ කෙරේ බලපාන්නාවූ ගැටලු පිළිබඳවත්, ඒවාගේ සංකීර්ණතාවය පිළිබඳවත් අදහස් ඉදිරිපත් කර ඇත.

- මොල්තස් විසින් මුල් කාල වලදී සහ පසුව ලියන ලද ලේඛනවල ජන සංඛ්‍යා වර්ධනයට වැඩි ආහාර (නිෂ්පාදනය) හෝ වැඩි රැකියා අවස්ථාවලට ප්‍රතිචාර ලෙස භූමියේ ඵලදායිත්වය වර්ධනය වන අන්දම දැක්වෙන ආදර්ශන (Models) දෙකක් ද හඳුන්වා ඇත.

- 1965, 1981 වර්ෂවලදී ජනගහනය, ආහාර නිෂ්පාදනය වැඩි කිරීම කෙරෙහි බලපෑම් කරන ආකාරය පිළිබඳව බොසරප් විසින් අදහස් ඉදිරිපත් කර ඇත.

- හෙයාමි, රටින් සහ බින්ස් වැන්ගර් විසින් වැඩිවන ජනගහනය නිසා හෙක්ටයාරකට වැය වන ශ්‍රමයේ වැඩිවීමක් ද සිදුවන බවට තර්ක කර ඇත.

- සෙන් 1981 දී සාගතය විග්‍රහ කිරීමේ දී විෂය කරගත්, වර්ධනය වන්නාවූ ශ්‍රම හමුදාවේ බලපෑම් තුලින් ගොඩ නැගෙන ඉඩම් හිමිකම් ව්‍යුහයේ හා, ව්‍යාප්තියේ සිදුවන වෙනස්කම් පාලනය කිරීම කෙරෙහි ඉවහල්වන බව පවසයි.

ඉහත සඳහන් පරිදි විවිධ පර්යේෂණ තුලින් සහ අධ්‍යයන තුලින් න්‍යායයන් ඉදිරිපත් කර තිබුණ ද එම න්‍යායයන් වඩාත් යෝග්‍යවන්නේ ජනගහනය වැඩිවීමත් සමඟ භූමි පරිභෝජනය හා බිම් ඒකකයකින් ඵලදායීතාවය වැඩි කර ගැනීම සම්බන්ධ අධ්‍යයනයන් සඳහා ය. ( Liption 1990 p. 212 -214 )

ලෝකයේ සැම රටකම ඉඩම් කැබලිවීම විවිධාකාරයෙන් සිදුවේ. විශාල ජන සංඛ්‍යා වර්ධනයක් සිදුවන ඉන්දියාව, බංග්ලාදේශය , චීනය වැනි රටවල ඉඩම් කැබලි වීම බහුලව සිදුවන අතර ශ්‍රී ලංකාවේ ද ඉඩම් කැබලි වීම සිදුවේ. විවිධ අධ්‍යයන මගින් ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිපත්ති , කෘෂිබිම් වල අඩු වැඩි වීම්, ජනාවාස කරණය පිළිබඳවත් ඒ තුලින් භූමි පරිහරණයේ සිදුවී ඇති වෙනස්කම් පිළිබඳවත් තොරතුරු ඉදිරිපත් කර තිබුණද ඒවා සම්බන්ධයෙන් න්‍යායාත්මක කරුණු හෝ මත ඉදිරිපත් කිරීමක් පැහැදිලිවම සිදුකර නැත.